&× ´ {ÆæÈ à`ÑÍó
All Rights Reserved

# මධ්‍ය වාර පරීක්ෂණය 2015

**7 ශ්‍රේණිය** **නර්තනය** **කාලය පැය 02 යි.**

| නම/ විභාග අංකයඃ |
|---|

## I කොටස

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- වඩාත් ම නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01 දෙතිතේ ප්‍රභේද ගණන වන්නේ,

(1) දෙකකි. (2) තුනකි. (3) හතරකි. (4) හයකි.

02 උපකරණ ආධාරයෙන් වයන්නේ,

(1) රබාන (2) ගැටබෙරය (3) බුම්මැඩිය (4) දවුලබෙරය

03 පහතරට නැටුමේ වන්නම් ගණන වන්නේ,

(1) 18 කි. (2) 24 කි. (3) 32 කි. (4) 12 කි.

04 ''ගාන තෙල් සඳුන් වරලස ඔමරි කොට .....'' මෙය,

(1) පන් කවියකි. (2) වන්නමකි. (3) රබන් කවියකි. (4) මේවර කවියකි.

05 පඬුවස් රජ සම්බන්ධ කතා පුවත ඇතුළත් ශාන්තිකර්මය

(1) දෙවොල් මඩුව (2) කොහොඹා කංකාරිය

(3) පහන් මඩුව (4) කිරිමඩුව

06 කස්තිරම පිළිබඳව ප්‍රථමයෙන්ම අවබෝධයක් ලැබෙන්නේ,

(1) ගැමි නැටුම් නැටීමේ දී ය. (2) වන්නම් නැටීමේ දී ය.

(3) අත් සරඹ නැටීමේ දී ය. (4) වට්ටම් නැටීමේ දී ය.

07 වෙස්මුහුණු කලාව බහුලව භාවිතා කෙරෙන නර්තන සම්ප්‍රදාය වනුයේ,

(1) උඩරට (2) පහතරට (3) සබරගමු (4) මේ සියල්ලම

08 දණ්ඩි කඳ භාවිතයට ගනු ලබන්නේ,

(1) පා සරඹ නැටීමට (2) ගොඩ සරඹ නැටීමට

(3) ගැමි නැටුම් නැටීමට (4) වට්ටම් නැටීමට

09 උඩරට වන්නමක ප්‍රධාන කොටස් ගණනින්,

(1) 3 කි. (2) 4 කි. (3) 5 කි. (4) 6 කි.

10 අවුරුදු උත්සව සමයේ සමූහ වශයෙන් වාදනය කරන භාණ්ඩයකි

(1) උඩැක්කිය (2) විරිඳු රබාන (3) බංකු රබාන (4) බුම්මැඩිය

(ල. 10)

The National e-learning Portal for The General Education

● **පහත ප්‍රකාශ හරි නම් (✓) ලකුණ ද, වැරදි නම් (✗) ලකුණ ද වරහන් තුළ යොදන්න.**

11 ජිංගත ගොගො මාත්‍රා 4 තිතට අයත් බෙර පදයකි. ( )

12 වෙස් ඇඳුම මලය රජුගේ ඇඳුමට සමාන වන අතර එය උඩරට නර්තන සම්ප්‍රදායේ ප්‍රධාන ඇඳුම් කට්ටලයයි. ( )

13 හනුමා වන්නම සුළු තනි තිතට අයත් වන්නමකි. ( )

14 චලනය සිදුවන්නේ අවකාශයේ ය. ( )

15 වන්නමක් නැටීමේ දී පළමුව ගයන්නේ තානමයි. ( )

16 ''රැන්තක ජිංතක තරිකිට කුන්දත්, තාග්ග ජිංතක තරිකිට කුන්දත්, රැන්තක ජිංතක තරිකිට කුන්දත් තා...'' මෙය හතරවන ගොඩ සරඹයේ කස්තිරමයි. ( )

17 බෙර වාදනයෙන් තොරව අභ්‍යාස කරන්නේ පා සරඹයි. ( )

18 කුරුවිට ප්‍රදේශයේ ප්‍රචලිතව පවතින්නේ සබරගමු නර්තන සම්ප්‍රදාය වේ. ( )

19 විවිධ ශබ්ද හා නාදවලට අනුකූලව චරිත සඳහා නර්තන නිර්මාණය කළ හැකිය. ( )

20 තාලයක් තැබීමට අවශ්‍ය අඩුම මාත්‍රා ගණන හතරකි. ( )

(ල. 10)

● **පහත දී ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.**

21 දිග් බෙරයට කියන තවත් නමක් ලියන්න. ..........................................................................

22 කොහොඹා කංකාරියේ එන නැටුම් අංගයක් ලියා දක්වන්න. ..............................................

23 මහබිනික්මන ගැන කියැවෙන වන්නම කුමක් ද? ...........................................................

24 සේරමාන් රජු පිළිබඳ පුරාවෘත්තය අයත් ශාන්තිකර්මය කුමක් ද? ..................................

25 අතින් සහ කඩිප්පුවකින් වයන බෙරය කුමක් ද? ..............................................................

## II කොටස

(ල. 10)

● **ප්‍රශ්න 04 කට පමණක් පිළිතුරු සපයන්න.**

01 මාත්‍රා 2 + 3 තාලයට අයත් වන්නමක කවි පද දෙකක්, කස්තිරම හා බෙර පදය ප්‍රස්තාර කරන්න. ( ල. 10)

02 (1) අවකාශ භාවිතයේ ප්‍රධාන ප්‍රභේද 2 නම් කරන්න. ( ල. 05)

(2) ඔන්චිලිවාරම් කවියක් ලියන්න. ( ල. 05)

03 ''මහනුවර ඇසළ පෙරහැර'' යන මාතෘකාවට රචනාවක් ලියන්න. ( ල. 10)

The National e-learning Portal for The General Education